# ජාතික රාජ්‍ය සභාවේ
# 1975 අංක 24 දරන පොල් සංවර්ධන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 ජූනි මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1975 ජූලි මස 4 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් විශයෙන් පළ කරන ලදී)

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 24 දරන පොල් සංවර්ධන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 ජූනි මස 18 වන දින]

එල්.ඩී.—ඕ. 68/73

**1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 24 දරන පොල් සංවර්ධන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** පොල් සංවර්ධන පනතේ 62 වන වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එය එම පනතේ 63 වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 63 වන වගන්තිය ඇතුළත් කිරීම.

'පොල් සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම් වලට තල් සහ තාල වර්ගයට අයත් වෙනත් ඇතැම් ගස් සම්බන්ධයෙන් සඳහන් කිරීම් ද ඇතුළත් යයි තේරුම් ගත යුතු බව.

**63.** 20, 22, 23, 30, 44, 45, 46, 48, 49, 50, 51 සහ 62 වන වගන්තිවල පොල් සම්බන්ධයෙන් වූ යම් සඳහන් කිරීමකට, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, තල් සහ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන තාල වර්ගයේ වෙනත් ගස් සම්බන්ධයෙන් කෙරෙන සඳහන් කිරීමක් ද ඇතුළත් යයි තේරුම් ගත යුතු අතර, එකී වගන්තිවල යෙදෙන "පොල් නිෂ්පාදනය", "පොල් වැවිල්ල", "පොල් ගස" සහ "පොල් කර්මාන්තය" යන යෙදුම් ඒ අනුව තේරුම් ගත යුතුය.'.

2—ඒ 14112—10,857 (75/4)